දරුවන් උදෙසා
බයිබලයක්

# පේතෘස් හා
# යාච්ඤාවේ බලය



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

ප්රේරිතවූ පේතෘස්, ජේසුස් වහන්සේ
ගැන අන් අයට පැවසීමට රට
පුරා සංචාරය කළේය. දිනක්,
ලිද්දාය නම් නගරයේදී, ඔහුට
අවුරුදු අටක් අංශභාගය
වැළඳී ඇඳේ සිටි මිනිසෙක්
මුණගැසුණි. “ජේසුස්
ක්රිස්තුස් ඔබව සුව කරන
සේකැ”යි පේතෘස් පැවසීය.
“නැඟිට ඔබේ ඇඳ රැගෙන
යන්න.” මිනිසා වහාම
නැඟිට සිටියේය. මෙය
දුටු ජනතාව ස්වාමීන්
වහන්සේ වෙතට
හැරුණෝය.





අසළ වූ යොප්පාව නම් නගරයේ මිනිස්සු දුක් වුණෝය. දොර්කස් නම් කිතුණු කාන්තාවක් මිය ගොස් තිබුණි. කණගාටුදායක ලෙස ඇගේ මිතුරෝ ඇගේ දේහය භූමදානය සඳහා සූදානම් කර, ඇයගේ සිරුර ඉහළ මාළයේ කාමරයක තබා වැළපෙමින් සිටියෝය.



එහෙත් පේතෘස් එම
ප්‍රදේශයේ සිටින බව
දොර්කස්ගේ මිතුරන්ට
ආරංචි විය. ඔවුන්
පේතෘස්ට වහාම
යොප්පාවට එන්න කියා
කීවෝය. ඔහු එම උඩුමහල්
කාමරයට පැමිණි විට,
වැන්දඹුවෝ දොර්කස්
ඔවුන් වෙනුවෙන් සෑදූ ඇඳුම්
සහ පැළඳුම් ඔහුට
පෙන්වූවෝය. සියල්ලෝ
හඬමින් හිටියෝය.

නමුත් පේතෘස් ඔවුන්
සියල්ලන්ම එළියට යවා,
දණින් වැටී යාච්ඤා
කළේය. ඔහු ඇයගේ
ශරීරය දෙසට හැරී,
“දොර්කස්,
නැඟිටින්නයැ”යි කීවේය.
ඇය ඇස් ඇර, පේතෘස්
දුටු විට ඇය නැඟිට
සිටියාය.





ඉන්පසු ඔහු ඇයට
අත දී ඇයව ඔසවා
තැබුවේය. ඔහු
සාන්තුවරයන්
(කිතුණුවන්) සහ
වැන්දඹුවන් කැඳවූ
විට, ඔහු ජීවත්ව
සිටින ඇයව ඉදිරිපත්
කළේය. එය
යොප්පාව පුරාම
ප්‍රසිද්ධ විය,
බොහෝ දෙනෙක්
ස්වාමින් වහන්සේව
අදහාගත්තෝය.



පේතෘස් යොප්පාවේ මුහුද අසළ නිවසක බොහෝ කාලයක් නැවතී සිටියේය. දිනක් පේතෘස් යාච්ඤා කිරීමට නිවසේ පියස්ස උඩට ගියේය.



ඔහු නගරයේ පවුරින් එපිට බැලුවේ නම්,

ඔහු සොයා එන සංචාරකයින් තිදෙනෙකු දකින්නට ඉඩ තිබුණි.


ඒ තිදෙනා දෙවියන් වහන්සේට නමස්කාර කළ කොර්නේලියස්
නම් රෝම සොල්දාදුවෙකුගේ සේවකයෝ වූවෝය.
කොර්නේලියස් පේතෘස්ව සොයාගැනීමට තම
සේවකයන්ව යැව්වේ
දේවදූතයෙක් ඔහුට
දර්ශනයකින්
පෙනී, “පේතෘස්
ගෙන්වන්න. ඔහු
මුහුද අසල සම් පදම්
කරන්නෙකු වූ සීමොන්
සමඟ නවාතැන් ගෙන
සිටියි. ඔබ කළ යුතු දේ
ඔහු ඔබට කියනු
ඇතැ”යි කී බැවිනි.

පේතෘස් ගෙය උඩ යාච්ඤා කරද්දී දෙවියන් වහන්සේ ඔහුට දර්ශනයක් පෙනෙන්න සැළැස්වූ සේක. එය පොළොවට පහත් කරන ලද විශාල ඇතිරිල්ලක් මෙන් දිස් විය. එහි සතුන් සහ කුරුල්ලන් විය. මේවා “අපිරිසිදු” බව පේතෘස් දැන සිටියේය. එනම් භක්තිමත් යුදෙව්වන්ට ඒවා කෑම අකැප විය. එක්වරම ඔහුට හඬක් ඇසිණි. “නැගිටින්න, පේතෘස්, මරා කන්න.”



“එසේ නොවේවා ස්වාමීනි!” පේතෘස් දෙවියන් වහන්සේට කීවේය. “මක්නිසාද මම කිසි කලෙක අකැප හෝ අපිරිසිදු හෝ කිසිවක් අනුභව කර නැත.” ඔහුට දෙවන වරටත් හඬ ඇසුනේය. “දෙවියන් වහන්සේ පවිත්‍ර කළ දේ ඔබ අකැපයැයි නොකියන්න.” මෙය තුන් වරක් සිදු වූයේය. ඉන්පසු ඇතිරිල්ල නැවතත් ස්වර්ගයට එසවී ගියේය.





පේතෘස්ට ඒ දර්ශනයේ අර්ථය නොතේරුණි. ඔහු ඒ ගැන කල්පනා කරන විට, මිනිසුන් තිදෙනෙකු ඔහුව සොයන බවත් ඔවුන් සමඟ යා යුතු බවත් දෙවියන් වහන්සේ ඔහුට කී සේක. දේවදූතයෙකු කොර්නේලියස්ට තමාව ගෙන්වන ලෙස පැවසූ බව මිනිසුන් තිදෙනා පේතෘස්ට කී විට, දෙවියන් වහන්සේ තමාව මෙහෙයවන බව පේතෘස් දැන ගත්තේය. ඊළඟ දවසේ ඔහු මිතුරන් හය දෙනෙකු සමඟ කොර්නේලියස්ගේ නිවසට ගියේය.



ඇතැම්විට, ඔහු යුදෙව් නොවන මිනිසෙකුගේ නිවසට යන අතරතුර, දෙවියන් වහන්සේ සියලු මිනිසුන්ට ප්‍රේම කරන බවත්, ජේසුස් වහන්සේ ලෝකයේ ගැළවුම්කරුවා බව සියලු ජාතීන් දැන ගැනීමට දෙවියන් වහන්සේට අවශ්‍ය බවත් පේතෘස් තේරුම් ගත්තා විය හැකිය. පේතෘස් පැමිණි විට, කොර්නේලියස් ඔහු ඉදිරියෙහි වැඳ වැටී නමස්කාර කළේය.

“නැගිටින්න. මමත් මනුශ්‍යයෙක්මි”යි පේතෘස් කොර්නේලියස්ට කීවේය. එවිට ඔහු නිවසේ සිටි සියල්ලන්ට කතා කොට, “යුදෙව් මිනිසෙකු වෙනත් ජාතියක කෙනෙකු සමඟ ඇසුරු කිරීම හෝ වෙනත් ජාතියක් වෙත යෑම හෝ කොතරම් නීති විරෝධීද කියා ඔබ දන්නවා ඇතැ”යි කීවේය. “එහෙත් මම කිසිම මිනිසෙකු අකැප හෝ අපවිත්‍ර යැයි හෝ කිව නොයුතු බව දෙවියන් වහන්සේ මට පෙන්වා දී ඇත.”



පේතෘස් මෙම අන්‍ය ජාතීන්ට (යුදෙව් නොවන අයට) පැවසුවේ ජේසුස් වහන්සේ යනු කුරුසියේ මිය ගොස් නැවත නැඟිට ලෝකයේ ගැලවුම්කරුවා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන බවය. එවිට ශුද්ධාත්මයාණන් ඔවුන් සියල්ලන් කෙරෙහි පහළ වූ අතර ඔවුන් සියල්ලෝ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමට පටන් ගත්තෝය. පේතෘස්ගේ යුදෙව් මිතුරන් හයදෙනා මහත් සේ පුදුමයට පත් වූවෝය. එය පෙන්තකොස්ත දිනය මෙන් විය. ශුද්ධාත්මයාණන්ගේ ත්‍යාගය අන්‍ය ජාතිකයන් කෙරෙහි ද වැගිරෙමින් තිබිණි.



ඉන්පසු පේතෘස් ජේසුස් වහන්සේ අදහාගත් නව ඇදහිලිවන්තයන් බව්තීස්ම කළේය.



ජෙරුසලමේදී ක්රිස්තියානීන්, අන්යජාතිකයන් බැලීමට යාම ගැන පේතෘස්ට බැණ වැදුණෝය. එවිට පේතෘස් තමාට සහ කොර්නේලියස්ට යාච්ඤාවෙන් ලැබුණු දර්ශන ගැන ඔවුන්ට පැවසුවේය. එය ඇසූ විට ජෙරුසලමේ කිතුණුවන් නිහඬ වූවෝය. තවද, ඔවුන් දෙවියන් වහන්සේව මහිමයට පත් කළ අතර, යාච්ඤාවෙන්, දෙවියන් වහන්සේගේ ප්රේමය සෑම කෙනෙකුටම අයිති බව කිතුනු සභාවට පෙන්වූවෝය.



පේතෘස් හා යාච්ඤාවේ බලය

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ක්‍රියා 9-12

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදු අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)